**විෂයය**

බුද්ධ ධර්මය

**නිපුණතාව**

ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම**

පළමු ධර්ම සංගායනාව අධ්‍යයනය කර, අර්බුද හා ගැටුම් නිරාකරණය කර ගනියි.

**පාඩම 18**

සසුන්කෙත රැක්මට බැඳුණ රන්වැට

සැකසුම - පූජ්‍ය තාරපේරියේ ගුණරතන හිමි

**8 ශ්‍රේණිය**

**බුද්ධ ධර්මය**

**18 වන පාඩම**

**සසුන්කෙත රැක්මට බැඳුණ රන්වැට**

**i කොටස**

01. පළමු ධර්ම සංගායනාව පවත්වන ලද්දේ බුද්ධ පරිනිර්වාණයෙන්.

1. තෙමසකට පසුවයි. 2. වසර සියයකට පසුවයි.
3. වසර 236 කට පසුවයි. 4. පළමුවන සියවසේ දීය.

02. පළමු ධර්ම සංගායනාව පැවැත්වීමට ගතවූ කාලය.....

1. මාස 7යි. 2. මාස 8යි. 3. මාස 9යි 4. මාස 10යි.

03. සංයුක්ත නිකාය පවරන ලද්දේ .......

1. ආනන්ද හිමි ප්‍රධාන ශිෂ්‍ය පිරිසටයි.
2. සැරියුත් හිමි ප්‍රධාන ශිෂ්‍ය පිරිසටයි.
3. මහා කාශ්‍යප හිමි ප්‍රධාන ශිෂ්‍ය පිරිසටයි.
4. අනුරුද්ධ හිමි ප්‍රධාන ශිෂ්‍ය පිරිසටයි.

04. ප්‍රථම ධර්ම සංගායනාව පවත්වන ලද ස්ථානය වූයේ ...............................

1. රජගහනුවර වේභාර පර්වතය පාමුල සප්තපර්ණී ගුහා ද්වාරය අභියසය
2. පැළලුප්නුවර අශෝකාරාමයේදී ය.
3. විශාලා මහනුවර වාලුකාරාමයේදී ය.
4. මාතලේ අළුවිහාරයේදී ය.

05. මහරහතන් වහන්සේලා පන්සියක් සහභාගී වූ බැවින් පළමු ධර්ම සංගායනාව.....

1. පංච සතිකා සංගීති ලෙස හැඳින් වේ.
2. සත්ත සතිකා සංගීති ලෙස හැඳින් වේ.
3. සහස්ස සතිකා සංගීති ලෙස හැඳින් වේ.
4. සීගිරිය සතිකා සංගීතය ලෙස හැඳින් වේ.

06. විනය පිටකයට අදාළ කොටස මුඛ පරම්පරාගතව පවත්වගෙන යාම.....

1. ආනන්ද හිමියන්ට පවරන ලදී.
2. උපාලි හිමියන්ට පවරන ලදී.
3. මහා කාශ්‍යප හිමියන්ට පවරන ලදී
4. අනුරුද්ධ හිමියන්ට පවරන ලදී.

07. පළමු ධර්ම සංගායනාවේ මූලිකත්වය ගෙන ක්‍රියා කළේ...

1. ආනන්ද මහ රහතන් වහන්සේ ය.
2. අනුද්ධ මහරහතන් වහන්සේ ය.
3. උපාලි මහරහතන් වහන්සේ ය.
4. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ය.

08. පළමුවැනි ධර්ම සංගායනා පවත්වන ලද්දේ...

1. පැළලුප් නුවර අසෝකාරාමයේ ය.
2. රජගහනුවර සප්තපර්ණී ගුහා ද්වාරයේ ය.
3. වාළුකාරාමයේ ය.
4. පූර්වාරාමයේ ය.

09. ථේරිකා සංගීතය යනුවෙන් හැඳින්වෙන්නේ .....

1. පළමුවන සංගායනාවයි.
2. දෙවන සංගායනාවයි.
3. තෙවන සංගායනාවයි.
4. සිව්වන සංගායනාවයි.

10. ශාසන ඉතිහාසයේ සඳහන් ආකාරයට භාරතය තුළ පැවති ධර්ම සංගායනා කීයද?

1. 2ක් 2. 3ක් 3. 4ක් 4. 5ක්

## ii කොටස

01. i. ප්‍රථම ධර්ම සංගායනාවට මුල් වූ හේතුව කුමක්ද?

    ii. එම ධර්ම සංගායනාව සිදු කළ අයුරු කෙටියෙන් දක්වන්න.

    iii. පළමු ධර්ම සංගායනාවේ ප්‍රතිඵල තුනක් ලියන්න.

02. i. පළමු ධර්ම සංගායනාවේදී ධර්මය පිළිබඳ ප්‍රශ්න විමසනු ලැබූ තෙරුන් වහන්සේගේ නම ලියන්න.

    ii. ධර්මය නිකාය වශයෙන් බෙදා දැක්වූ කොටස් අතුරින් තුනක් ලියන්න.

    iii. සමාජ ගැටලු විසඳා ගැනීමේදී පළමු ධර්ම සංගායනාවෙන් ගත හැකි ආදර්ශ පහක් ලියන්න.

03. i. පළමු ධර්ම සංගායනාවේ දී විනය ප්‍රශ්න යොමු කළ තෙරුන් වහන්සේගේ නම ලියන්න.

    ii. පළමු ධර්ම සංගායනාවේ මූලිකත්වය දැරූ මහරහතන් වහන්සේ, අනුග්‍රහකත්වය දැක් වූ රජතුමා, පැවැත් වූ ස්ථානය සඳහන් කරන්න.

    iii. විනය පිටකය බෙදන ලද කොටස් පහ මොනවාද ?

**පිළිතුරු**

**I කොටස**

1. 1
2. 1
3. 3
4. 1
5. 1
6. 2
7. 4
8. 2
9. 1
10. 2

**ii කොටස**

1. i. සුභද්‍ර භික්ෂුගේ නොහික්මුණු ප්‍රකාශය.

   ii. ප්‍රශ්න විමසා පිළිතුරු ලබා ගැනීමේ ක්‍රමය භාවිතයට ගෙන විනය ශාසනයේ ආයුෂ ලෙස සැලකූ බැවින් පළමුව විනය සංගායනා කරන ලදී. විනය පිළිබඳ උපාලි හිමියන් ගෙන් ප්‍රශ්න විමසූ අතර ධර්මය පිළිබඳ ආනන්ද හිමියන්ගෙන් ප්‍රශ්න විමසන ලදී.

   iii.
   - ධර්මය විනය එක්රැස් කිරීම.
   - ධර්මය විනය කොටස්වලට බෙදා භාණක පරම්පරාවන්ට පැවරීම.
   - ධර්මය හා විනය බුදු සසුනේ නායකත්වයට යොදාගැනීම.
   - කුඩා අනු කුඩා ශික්ෂාපද ගැටලුව විසඳාගැනීම.
   - සසුනට සිදුවිය හැකිව තිබූ හානි වළක්වා ගැනීමට හැකිවීම.
   - ආනන්ද හිමියන්ට එල්ලවී තිබුණු චෝදනා වලින් නිදහස්වීම

2. i. ආනන්ද මහ රහතන් වහන්සේගෙන්....

ii. • දීඝ නිකාය
- මජ්ඣිම නිකාය  නිකාය
- සංයුක්ත නිකාය
- අංගුත්තර නිකාය
- ඛුද්දක නිකාය

iii. • විනය ගරුකත්වයේ හා නීතිගරුකත්වයේ වැදගත්කම අවධාරණය කිරීම.

- සාකච්ඡාවෙන් සාමූහිකව තීරණවලට එළැඹීමට හැකි වීම.
- සාමූහිකව කටයුතු කිරීම තුළින්  ගැටලු  නිරාකරණය කර ගැනීමට හැකි වීම.
- ගැටලු විසඳීමේ දී බුද්ධිමතුන්ගෙන් හා විශේෂඥයන්ගෙන් දැනුම ලබාගැනීම.
- යම් යම් ගැටලු අනාගතයේ දී  ඇතිවීම වැළැක්වීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් ඉදිරිපත් කිරීම.
- අවශ්‍ය අවස්ථාවන්හිදී රාජ්‍ය අනුග්‍රහය ගැනීමට යොමුවීම.
- සැලසුම් සහගත ව කිසියම් ක්‍රියාකාරකමක් සිදු කිරීම තුළින් යහපත් ප්‍රතිඵල උදාකර ගැනීමේ හැකියාව ලැබීම.

03. i. උපාලි මහරහතන් වහන්සේට

ii. • මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ
- අජාසත්ත මහා රජු
- රජගහනුවර වේභාර පර්වතය පාමුල සප්තපර්ණී ගුහාද්වාරයේදී

iii. • පාරාජිකා පාලි
- පාචිත්තිය පාලි
- චුල්ලවග්ග පාලි
- මහා වග්ග පාලි
- පරිවාර පාලි